# ක්‍රිකට් හා ත්‍රස්තවාදය

දකුණු ආසියාවේ රටවල් අතර ක්‍රිකට් ජනප්‍රිය වී ඇත්තේ ලංකාව, ඉන්දියාව, පකිස්ථානය හා බංගලාදේශය යන රටවල ය. එයින් ලංකාව හැරෙන්නට අනෙක් රටවල් පැරණි භාරත දේශයේ කොටස් විය. භාරතය යනු දේශයක් මිස කිසි දිනෙක රටක් නොවුණු බව අමතක නොකළ යුතු ය. එහි කිසි දිනෙක ජාතියක් තිබී ද නැත. එහෙත් ලංකාවේ එසේ නො වී ය. ලංකාව රටක් වූවා පමණක් නොව ජාතියක් ඇති රාජ්‍යයක් ද විය. කෙසේ වෙතත් ඉහත සඳහන් රටවල්වල ක්‍රිකට් ජනප්‍රිය වූයේ බ්‍රිතාන්‍ය අධ්‍යාපනය හේතුකොටගෙන ය. පළමුව ඒ රටවල ඉංගිරිසි කතාකරන ප්‍රභූන් අතර ද පසුව සාමාන්‍ය ජනතාව අතර ද ක්‍රිකට් ජනප්‍රිය විය. ඉංගිරිසි අධ්‍යාපනය (මින් අදහස් කෙරෙන්නේ ඉංගිරිසි මාධ්‍යයෙන් ලබාදෙන අධ්‍යාපනයක් නොව සිංහලෙන් හා දෙමළෙන් ද ලබාදෙන බ්‍රිතාන්‍ය හා දැන් දැන් නම් ඇමෙරිකන් අධ්‍යාපනය ය.) වඩාත් ම පැතිරී ඇත්තේ ලංකාවෙහි බැවින් රූපවාහිනියට පෙර ක්‍රිකට් වඩාත්ම ජනප්‍රිය වූයේ ලංකාවෙහි යැයි කිව හැකි ය. එහෙත් දැන් රූපවාහිනිය හේතුකොටගෙන ඉහත කී අනෙක් රටවල ද ගම් නගර සිසාරා ක්‍රිකට් පැතිරී යයි.

එකල ක්‍රිකට් ක්‍රීඩකයෝ ඉංගිරිසි කතාකරන අය අතරින් ම පැමිණියහ. එසේ වුවත් අද ආසියාතික රටවල ක්‍රිකට් ක්‍රීඩකයන් අතර තම තම රටවල භාෂා කතාකරන එහෙත් ඉංගිරිසි කතානොකරන කී්ඩකයෝ වෙති. පසුගිය දිනවල ඉංගිරිසි කතා නොකරන ක්‍රීඩකයන්ට ඉංගිරිසි ඉගැන්විය යුතු ය යන්න ලංකාවේ ඉංගිරිසි උගත් සමහරුන් අතර පඬි සාකච්ඡාවල මාතෘකාවක් විය. මේ ඇතැම් පඬියන් ත්‍රස්තවාදීන්ට ඉංගිරිසි ඉගැන්වීමට යැවිය යුතු ය. එවිට බ්‍රිතාන්‍යයන්ට හා ඇමරිකානුවන්ට රාජ්‍ය නොවන සංවිධාන ඔස්සේ නොගොස් සෘජුව ම ත්‍රස්තවාදීන්ට උපදෙස් දීමට හැකිවනු ඇත. පඬියන්ට එවැනි ව්‍යාපෘතියක් ඉදිරිපත්කර කීයක්වත් උපයා ගැනීමට ද හැකිවනු ඇත. ඒ කුමක් වුවත් පකිස්ථානයේ දී ලංකා ක්‍රිකට් ක්‍රීඩකයන්ට ත්‍රස්තවාදීන් පහර දී ඇත. ඒ ත්‍රස්තවාදීන් ඉංගිරිසි කතාකරන්නේ ද නැත් ද යන්න දැනගැනීමට නොහැකි වුවත් ක්‍රිකට් ක්‍රීඩකයන් බේරාගැනීමට ගොස් පකිස්ථානයේ ආරක්ෂක අංශවල කිහිප දෙනකු මිය ගොස් ඇත. එලෙස මියගිය අයගේ නාමයට අපේ ප්‍රණාමය පිරි නැමෙයි. එසේම ක්‍රීඩකයන් රැගත් බසයේ රියදුරාගේ දක්ෂතාව ද මෙහි දී අගය කළ යුතු වෙයි. ප්‍රශ්නය වනුයේ ක්‍රිකට් ක්‍රීඩකයන්ට පකිස්ථානයේ දී ම ප්‍රහාරයක් එල්ල වූයේ ඇයි ද යන්න ය.

අපේ රටට ජාත්‍යන්තරයෙහි ප්‍රධාන සතුරෝ දෙදෙනෙක් වෙති. එක් කණ්ඩායමක ඇත්තේ බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ රටවල් ය. එහි ප්‍රමුඛත්වය ගන්නේ බ්‍රිතාන්‍ය ය. නෝර්වේ යනු බ්‍රිතාන්‍යයේ හා ඇමරිකාවේ බළල් අතක් පමණ ය. අනෙක් කණ්ඩායමේ ඇත්තේ එක් රටකි. ඒ ඉන්දියාව ය. අද ඉන්දියානු ආණ්ඩුව ලංකාණ්ඩුවත් සමග යම් අවබෝධයකට පැමිණ ඇත. ලංකාව ඉන්දියාවට තර්ජනයක් නොවන බව එරට ආණ්ඩුව දනියි. එහෙත් ඉන්දියාවේ සාමාන්‍ය ආණ්ඩුව හැරෙන්නට තවත් ආණ්ඩු දෙකක් වෙයි. එකක් ඉන්දීය විදේශ සේවය ද අයත් ඉන්දීය රාජ්‍ය සේවය ය. අනෙක රෝ නමින් හැඳින්වෙන ඉන්දීය ඔත්තු සේවය ය. පසුව කියන ලද ආණ්ඩු දෙක එදත් අදත් ලංකාවට විරුද්ධ ය. එහි ඇත්තේ බාහ්මණ ආධිපත්‍යයකි. බ්‍රාහ්මණයෝ එදත් අදත් බුද්ධදහම මුල්කරගෙන ලංකාවට විරුද්ධ වෙති. ඒ මදිවාට තමිල්නාඩුවේ කොටින්ට ආධාර කරන ජාතිවාදී දේශපාලනඥයෝ වෙති.

පකිස්ථානයෙහි ත්‍රස්තවාදීන් සිටින බව ඉන්දියාව මෙන් ම ඇමරිකාව ද කියයි. පකිස්ථානය අල් ක්වයිඩා ත්‍රස්තවාදීන්ට ක්ෂේම භූමියක් ව පවතින බව බටහිර රටවල මතය වෙයි. ඇමරිකාවට ඇත්තේ අල් ක්වයිඩා හා වෙනත් මුස්ලිම් ත්‍රස්තවාදීන්ගේ ප්‍රශ්නය මිස අනෙක් ත්‍රස්තවාදී සංවිධානවල ප්‍රශ්න නො වේ. ඇමරිකාව එරට කොටි සංවිධානය තහනම් කර ඇත්තේ කොටි මුස්ලිම් ත්‍රස්තවාදී සංවිධාන සමග සම්බන්ධ හෙයින් මිස කොටින්ගෙන් ලංකාවට ඇති වී තිබෙන ප්‍රශ්නය සැලකිල්ලට ගෙන නො වේ. වෙනත් බටහිර රටවල් ද ඒ ඒ රටවල කොටි සංවිධානය තහනම් කර ඇත්තේ ඒ හේතුව නිසා ය. ඉන්දියාව කොටි සංවිධානය තහනම් කර ඇත්තේ රජිව් ගාන්ධි මරා දැමූ නිසා මිස වෙනත් හේතුවක් නිසා නොවන බව ද අප මතක තබාගත යුතු ය. ඕනෑම රටක විදේශ ප්‍රතිපත්තිය සකස් වන්නේ රටේ ආරක්ෂාව ගැන සැලකිලිමත් වෙමිනි. රටක විදේශ ප්‍රතිපත්තිය යනු අභ්‍යන්තර ප්‍රතිපත්තියෙහි ම විස්තීරණයක් පමණකි යැයි කියමනක් වෙයි. එහි සත්‍යතාවක් ඇති බව පැහැදිලි ය. අපට තේරෙන අයුරින් ලංකාව පසුගිය කාලයේ කොටි සංවිධානය තහනම් නො කෙළේ කොටි සංවිධානය සමග සාකච්ඡා කළ යුතු යැයි සිතීමට බටහිරයන් හා මෙරට

© Prof. Nalin De Silva

සිටින ඔවුන්ගේ හෙංචයියන් ආණ්ඩුවට බලපෑම් දමා තිබුණු බැවිනි. චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය ඒ බලපෑම්වලට යටවිය. එහෙත් අද මහින්ද රාජපක්ෂ මහතාගේ ආණ්ඩුවට බටහිර රටවල් වැදගත් නො වේ. කොටි සමග සාකච්ඡාවකට විරුද්ධ වූවන්ගේ මතය අද රටෙහි තහවුරු වී ඇත.

ආණ්ඩුව වැයම් කෙළේ කොටින්ට විරුද්ධව මානුෂික මෙහෙයුම් පටන් ගත් අවධියෙහි තමන් කොටි සමග සාකච්ඡාවකට  ඕනෑම අවස්ථාවක සූදානම් බව ලෝකයට පෙන්වීමට යැයි සිතිය හැකි ය. එබැවින් කොටි සංවිධානය තහනම් නොකර කාලයක් බලා සිටීමට ආණ්ඩුවට සිදුවිය. ආණ්ඩුව අවසාන වශයෙන් කොටි තහනම් කෙළේ කොටි බලය දුර්වල වීමෙන් පසු කොටි සමග සාකච්ඡා කිරීමට තවදුරටත් බලපෑම් දැමීමට බටහිරයන්ට නොහැකිවීමෙන් පසුව ය. බටහිර ආණ්ඩු කොටි සමග කරන සාකච්ඡා ගැන අද නිහඬ ය.  අද කොටි සමග සාකච්ඡා කළ යුතු යැයි රජයක් ලෙස කියන්නේ ඉන්දියාව ය. ඒ තමිල්නාඩුවේ බලපෑම හේතුකොටගෙන ය.

ක්‍රිකට් කණ්ඩායමට පහරදීම පිටුපස ලෂ්කාර් නම් ත්‍රස්තවාදී සංවිධානය ඇති බව ඉන්දියාවේ අදහස බව හින්දු පුවත්පතේ සඳහන් වී ඇත. මුම්බායි ප්‍රහාරය ද ඔවුන් විසින් කරන ලද්දක් යැයි ඉන්දියාව කියයි. මුම්බායි ප්‍රහාරයත් ලාහෝරයේ දී ක්‍රිකට් කණ්ඩායමට කරන ලද ප්‍රහාරයත් කොමාන්ඩෝ ආකාරයේ ප්‍රහාර බවත් ලෂ්කාර් නමින් හැඳින්වෙන සංවිධානයට එවැනි ප්‍රහාර කළහැකි බවත් පකිස්ථානය මුම්බායි ප්‍රහාර සම්බන්ධයෙන් ඒ සංවිධානය තහනම් කර ඇති බැවින් පකිස්ථානයෙන් පළිගැනීමට ක්‍රිකට් ක්‍රීසකයන්ට පහරදෙන්නට ඇති බවත් ඉන්දියාව කියයි. ලක්ෂාර් සංවිධානය පකිස්ථානයේ සිට ක්‍රියාත්මක වන බව ද පෙන්වා දීමට ඉන්දියාව අමතක නොකරයි.

ක්‍රිකට් කණ්ඩායමට පහර දී ඇත්තේ කොටි සංවිධානය, කොටින්ගේ අවශ්‍යතාව මත ඔවුන් සමග සම්බන්ධකම් ඇති මුස්ලිම් ත්‍රස්තවාදී කණ්ඩායමක්, ඉන්දියාවේ ඔත්තු සේවය විසින් යොදාගන්නා ලද ත්‍රස්තවාදී කණ්ඩායමක්, බටහිරයන් විසින් යොදාගන්නා ලද ත්‍රස්තවාදී කණ්ඩයමක්, බටහිර හා ඉන්දියාවේ ඔත්තු සේවා එක්වී යොදාගන්නා ලද කණ්ඩායමක් විය හැකි ය. පකිස්ථානය කිසියම් ආකාරයකටවත් එයට සම්බන්ධ නැති බව පැහැදිලි ය. පකිස්ථාන් රජයෙන් පළිගැනීමට එරට ත්‍රස්තවාදී සංවිධානයක් එසේ පහර දෙන්නට ඇතැයි යන්න ඉන්දියාවේ ගජබින්නයක් මිස අනෙකක් නොවිය හැකි ය.

කොටින්ගේ වර්තමාන තත්වය අනුව ඔවුන්ගේ කණ්ඩායමකට පකිස්ථානයට ගොස් ක්‍රිකට් කණ්ඩායමට පහරදීමට ඇති හැකියාව ඉතාමත් අඩු ය. එහෙත් ඔවුන් සම්බන්ධකම් පවත්වන වෙනත් ත්‍රස්තවාදී සංවිධානයක් ලවා ඒ කිරීමට ඔවුන්ට හැකියාවක් වෙයි. ඇමරිකාවට හෝ බ්‍රිතානියට හෝ වෙනත් ත්‍රස්තවාදී සංවිධානයක් ලවා පහරදීමට සැලසුම් කිරීමට ඇති ඉඩකඩ අඩු ය. වඩා ඉඩක් ඇත්තේ ඉන්දියාවේ ඔත්තු සේවය ත්‍රස්තවාදී සංවිධානයක් ලවා ඒ පහරදීම සැලසුම් කිරීමට ය. ඔත්තු සේවයට ක්‍රිකට් අවශ්‍ය නැත. එහි සේවය කරන්නන් ද බ්‍රිතානි අධ්‍යාපනයක් ලැබූ අය බැවින් ක්‍රිකට් ක්‍රීඩාවට කැමැත්තක් දැක්වුවත් ඔවුන්ට අවශ්‍ය කාර්යය ඉටුකර ගැනීම සඳහා ක්‍රිකට් ක්‍රීඩකයන් බිලි දීම ඔවුන්ට සුළු දෙයකි. යම්කිසි අයුරකින් ක්‍රිකට් ක්‍රීඩකයන්ට බරපතළ අනතුරක් වී නම් එමගින් මහින්ද රාජපක්ෂ මහතාට හා ආණ්ඩුවට තදබල චෝදනාවක් එල්ල වීමට තිබුණි. දැනටත් ඒ ජා ප මන්ත්‍රීවරු ක්‍රිකට් කණ්ඩායම පකිස්ථානයට යැවීම ගැන ආණ්ඩුවට චෝදනා කරති.  ක්‍රිකට් ක්‍රීඩාවේ ජනප්‍රියබව නිසා ම ක්‍රිකට් ක්‍රීඩකයන්ට අනතුරුකර ජනතාව ආණ්ඩුව කෙරෙහි කළකරවීමට හැකිකමක් තිබූ බව ඉන්දීය ඔත්තු සේවය දනියි. ඒ ඔස්සේ මානුෂික මෙහෙයුම් නතරකර ඊනියා සාම සාකච්ඡා ඇරඹීමට ආණ්ඩුවට බලකිරීම සඳහා ඉන්දියාවට (තමිල්නාඩුවට) අවස්ථාවක් ලබාදීමට ඔත්තු සේවයට හැකිකමක් තිබුණි. ඔවුන්ට පහරදීම  ඉන්දියාවේ දී කළහැකිව තිබුණු නමුත් ඉන් ඉන්දියාවට වන අපකීර්තිය මගහරවා ගැනීමේ අවශ්‍යතාව ද විය. ප්‍රහාරය පකිස්ථානයේ දී කිරීමෙන් ඉන්දියාවේ සතුරා වූ ද අපට ආයුධ ලබාදෙන අපේ මිතුරකු වූ ද පකිස්ථානයට පාඩමක් උගන්වා එරට අපකීර්තියට හෙළීමෙන් ඔත්තු සේවයට එක ගලින් කුරුල්ලන් දෙදෙනකු මරාගැනීමේ හැකියාව තිබුණි. ක්‍රිකට් ක්‍රීඩකයන්ට කළ පහරදීම කාගේ සැලසුමක් ද යන්න නිශ්චිතව  කිවහැකි නො වේ. එහෙත් ඉන්දියාවේ ඔත්තු සේවයට අනෙක් අයට ඇඟිල්ල දිගුකර තමන්ට චෝදනාවෙන් නිදහස්වීමට ඉඩදිය නො හැකි ය. මේ පිළිබඳ තොරතුරු හෙළිදරව් කිරීමේ වැඩිම ශක්‍යතාව ඇත්තේ ඉන්දියාවට බැවින් තොරතුරු හෙළි නොවීමට ඇති ඉඩකඩ ද වැඩි බව අමතක නොකළ යුතු ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva